**කළුතර ප්‍රාදේශීය සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කළුතර ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කළුතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) ( ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 15.8 ප්‍රකාරව ආපසු ගෙවිය යුතු ණය මුදලකට ඉදිරි වසර සඳහා ණය වාරික මුදල ජංගම වගකීම් ලෙස වත්කම් හා වගකීම් ප්‍රකාශනයෙහි දැක්විය යුතු වුවත්, 2020 වර්ෂයට අදාල ගෙවිය යුතු රු.643,739 ක අගය ජංගම වත්කම් වශයෙන් දක්වා නොතිබුණි. | ගිණුම් සකස් කිරීමේදී එලෙස සිදු කිරීමට උපදෙස් ලබා දී නොතිබුණි. | කෙටි කාලීන ණය වාරිකවල වටිනාකම ජංගම වගකීම් යටතේ දැක්විය යුතුය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගබඩා තොග ලේඛනයේ ගිණුම් විෂයයන් 11 කට අදාල අවසන් තොගය රු.152,866 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.126,843 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා අවසන් තොගය රු.26,023 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | අවසන් තොගවල නිවැරදි අගය අවසන් ගිණුම්වලට ගත යුතුය. |
| (ආ)ගිණුම් විෂයයන් 02 කට අදාල විදුලි හා කර්මාන්ත ආරම්භක තොග ශේෂය රු.419,175 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.431,505 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ආරම්භක තොගය රු.12,330 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | ආරම්භක තොගවල නිවැරදි වටිනාකම අවසන් ගිණුම්වලට ගත යුතුය. |
| (ඇ) ගබඩා ගිණුම් විෂයයන් 03 කට අදාල නිකුත් කිරීම් වටිනාකම රු.114,775 ක් වුවත්, එය රු.124,830 ක් ලෙස දක්වා තිබීම නිසා ආදායම් ප්‍රකාශයෙහි අතිරික්තය රු.10,055කින් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි. | | තොග නිකුත් කිරීම්වල නිවැරදි වටිනාකම ගිණුම්වලට ගැලපිය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2020 වර්ෂය තුල සභා ප්‍රතිපාදන යටතේ මාර්ග හා වෙනත් ඉදි කිරීම් ව්‍යාපෘති වල කළ වැඩ වටිනාකම ගෙවීම් වාර්තා අනුව පිරිවැය ප්‍රාග්ධනිත කිරීම් හා ණයහිමි වශයෙන් වෙන් කිරීම වෙනුවට ව්‍යාපෘති 28 ක ඇස්තමේන්තු පිරිවැය රු.16,659,588 ක් ප්‍රාග්ධනිත කර ණයහිමි වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ව්‍යාපෘති 28 න් 27 2020 දෙසැම්බර් 31 ට වැඩ අවසන් කර තිබුණ ද ගෙවීම් වාර්තා පිළියෙල කර නොතිබුණි. ශේෂ ගැලපීම් කර 2021 ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව | වැඩ අවසන් වාර්තා අනුව ණයහිමියන් හා ප්‍රාග්ධනිත කිරීම කළ යුතුය. |
| (ඉ) කර්මාන්ත අමුද්‍රව්‍ය මිලදී ගැනීම් රු.251,000 ක් සමාලෝචිත වර්ෂය තුල ගෙවීම් කලද, එය ණයහිමි වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | නිවැරදි ණයහිමි ශේෂය ගිණුම්වල දැක්විය යුතුය. |
| (ඊ) සභා ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 05 ක ණයහිමි වශයෙන් වෙන් කල යුතු රු.2,606,137 ක් වෙනුවට රු.2,715,000 ක් ගිණුම්ගත කිරිම නිසා ණයහිමියන් රු.108,863 ක් වැඩිපුර වෙන් කර තිබුණි. | 2021 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | නිවැරදි ණයහිමි ශේෂය අවසන් ගිණුම්වල ගැලපිය යුතුය. |
| (උ) වෙන්දේසි කර තිබූ භාණ්ඩ වර්ග 116 ක පිරිවැය හඳුනාගෙන පොත් වලින් ඉවත් කිරිමට කටයුතු කර නොතිබුණි. | පිරිවැය සොයා ගැනීමට මුලාශ්‍ර ලේඛන මෙතෙක් ලැබී නැත. ඉදිරියේදී පිරිවැය සොයා පොත්වලින් ඉවත් කරමි. | වෙන්දේසියෙන් පසු ඒවායේ පිරිවැය පොත්වලින් ඉවත් කළ යුතුය. |
| (ඌ) පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වටිනාකම රු.3,503,097 ක කාර්යාල උපකරණ ගිණුම්ගත කර නොතිබුණි. | | පරිත්‍යාග ලෙස ලැබීම් ගිණුම්ගත කළ යුතුය. |
| (එ) සමාලෝචිත වර්ෂය තුල අයකර තිබුණු රු.242,828 ක සේවක ණය ලැබිය යුතු අත්තිකාරම් ලෙස දක්වා තිබුණි. | | සේවක ණය ලැබීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.764,990 ක් වුවද, එය රු.858,959 ක් ලෙස දක්වා තිබීම නිසා වර්ෂයේ පොලී ආදායම රු.93,969 ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණි. | 2021 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | වර්ෂයේ ආදායම නිවැරදිව ගිනුම්ගත කළ යුතුය. |
| (ඔ) 2020 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු ශේෂය රු.9,555,176 ක් වුවද එය මුල්‍ය ප්‍රකාශන වල රු.10,030,284 ක් ලෙස රු.475,108 ක් වැඩියෙන් දක්වා තිබුණි. | | වත්කම්වල නිවැරදි අගය ගිණුම්වලට ගත යුතුය. |
| (ඕ) සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු සභික දීමනා රු.675,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | | වර්ෂයට අදාල ආදායම නිවැරදිව ගිණුම්වලට ගත යුතුය. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 03 කට අදාලව මුලා ප්‍රකාශනවල වටිනාකම හා අනුරූපි වාර්තාවල වටිනාකම අතර රු.9,668,585 ක වෙනසක් විය. | වෙනස හඳුනාගෙන ඉදිරියේදී නිවැරදි කරන බව | මුලා ප්‍රකාශනවල ශේෂයන් හා උපලේඛන ශේෂයන් සමාන විය යුතුය. |

## 2. මුලා සමාලෝචනය

### 2.1 මූලා ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූලා ප්‍රකාශන අනුව2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.66,631,388ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම වියදම රු.58,581,142 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති 06 ක් වෙනුවෙන් 2019 වර්ෂයේ හා ඊට පෙර වර්ෂවල සිට ලැබිය යුතු රු.1,506,191 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලැබී නොතිබුණි. | කළුතර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් සහ පළාත් පාලන දෙපාර්මේන්තුවෙන් මුදල් නොලැබුණු බව | ව්‍යාපෘති වෙනුවෙන් ලැබිය යුතු මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |